www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# පෙනිසිල්වේනියා ප්‍රාථමික මැතිවරනය සහ ඩිමොක්‍රැටික් පක්ෂයේ අර්බුදය

## The Pennsylvania primary and the crisis of the Democratic Party

**බැරී ග්‍රේ විසිනි**
**2008 අප්‍රේල් 26**

අප්‍රේල් 22 දා පැවති පෙනිසිල්වේනියා ප්‍රාථමික මැතිවරනයේ දී බැරක් ඔබාමා පරදවා හිලරි ක්ලින්ටන් ලැබූ විශ්වාසනීය ජයග්‍රහනය, ඩිමොක්‍රැටික් ජනාධිපති අපේක්ෂකත්වය සඳහා වන කටුක තරගය මාස ගනනක් නොවේ නම් සති ගනනක් තිස්සේ පවතිනු ඇති බව සහතික කරයි. වඩාත් වැදගත් කාරනාව නම්, එම පක්ෂය ග්‍රහනයට ලක් කර ගනිමින් වැඩෙන අර්බුදය එය මගින් අවධාරනය කෙරෙන බවයි.

මැතිවරනය මගින් එලිදරව් කෙරී ඇත්තේ වාර්ගික, ජනවර්ග, ස්ත්‍රී-පුරුෂ හා සෙසු ජන සංයුතිමය රේඛා ඔස්සේ ඉරී තලා යන පක්ෂයකි. කම්හල් වසා දැමීම හා කම්කරු පන්තියේ ජීවන මට්ටම් කඩා වැටීම මගින් විනාශයට ලක් වූ කාර්මික ප්‍රාන්තවල මීට පෙර පැවති ප්‍රාථමික මැතිවරනවල දී මෙන්, ඔබාමා අප්‍රිකානු-ඇමරිකානු ඡන්දවලින් අති මහත් බහුතරයක් ද තරුන ජනයාගේ ඡන්දවලින් විශාල බහුතරයක් ද දිනා ගත්තේ ය.

ක්ලින්ටන් සුදු ඡන්දදායකයන්, වැඩිමහල් ඡන්දදායකයන් හා කාන්තාවන් අතර දී ඔබාමාව පහසුවෙන් ම පරාජය කලා ය. අතලොස්සක් වන නාගරික මධ්‍යස්ථානවල කලු ජාතිකයන් සංකේන්ද්‍රනය වී සිටින අතර ඡන්දදායකයන්ගෙන් විශාල අනුපාතයක් වැඩිමහල් සුදු ජාතිකයන්ගෙන් සමන්විත මෙම ප්‍රාන්තයේ ජන සංයුතිය ක්ලින්ටන්ට ආසන්න වසයෙන් පරිපූර්න ජයග්‍රහනයක් ලද හැකි භූගෝලීය තත්වයක් නිර්මානය කර තිබේ. ඇය ප්‍රාන්තයේ පත්තු 67න් හතක් හැරුනු කොට අන් සියල්ල ම ජය ගත්තා ය.

ඔබාමාට ජයගත හැකි වූයේ පිලඩෙල්පියා, පිලඩෙල්පියාහි උප-නගර පත්තුවලින් දෙකක්, අසල පිහිටි ලැන්කැස්ටර්, ප්‍රාන්ත අගනුවර වන හැරිස්බර්ග් අයත් වන පත්තුව සහ පෙන් ප්‍රාන්ත විශ්වවිද්‍යාලය පිහිටා ඇති ස්ටේට් කොලීජ් වටා වූ පත්තු දෙක යන ප්‍රදේශ පමනි.

කලක් ප්‍රදේශයේ ගල් අගුරු කර්මාන්තයේ මධ්‍යස්ථාන වූ ප්‍රාන්තයේ නිරිතදිග පත්තු ඇතුලු බටහිර හා ඊසානදිග පෙනිසිල්වේනියාවේ පිහිටි ආර්ථිකව පරිපීඩිත කාර්මික ප්‍රදේශ තුල ක්ලින්ටන් විශාල බහුතරයකින් ජය ගත්තා ය.

වඩ වඩා විෂකුරු ස්වරූපයක් අත්පත් කර ගෙන ඇති හා ඩිමොක්‍රැටික් ඡන්දදායකයන් මෙන් ම පක්ෂ යාන්ත්‍රනය ද -- සමහර විට ආපසු හැරවිය නොහැකි මට්ටමකට -- භේද කර ඇති ප්‍රාථමික තරගයක් තව දුරටත් ඉදිරියට යාම සම්බන්ධයෙන් බොහෝ ඩිමොක්‍රැටික් අටුවාකරුවන් හා නිලධාරිහු සිය අත් අඹරමින් කල්පනා කරමින් සිටිති. මෙම විෂ ගැන්වුනු ක්‍රියාදාමය ධවල මන්දිරය රිපබ්ලිකන් අපේක්ෂකයා විය හැකි ජෝන් මැකේන්ට භාර දෙමින් ශරත් සෘතුවේ පැවැත්වෙන මහ මැතිවරනයේ දී පක්ෂයේ අවස්ථාවන් බාදනය කරනු ඇතැයි ඔවුහු කනස්සල්ලට පත්ව සිටිති.

සිය තරගකරුවා පක්ෂ අපේක්ෂකත්වය ලබා ගැනීමට අපොහොසත් වුව හොත් එක් එක් කඳවුර තුල සිටින සැලකිය යුතු කොටසක් මැතිවරනය වර්ජනය කිරීම වඩ වඩා විය හැකි දෙයක් බවට පත් වෙමින් තිබේ. එහෙත් මෙම අභ්‍යන්තර රුධිර ගලනය නතර කිරීමෙහි ලා පක්ෂ නායකත්වය කිසිවක් කර කියා ගත නොහැකි හා බල රහිත බවට පත්ව ඇති බවක් පෙනී යයි.

මැතිවරන ව්‍යාපාර දෙක අතර පවත්නා අන්‍යොන්‍ය විෂකුරු භේදය තිබිය දී ම, අපේක්ෂකයන්ගේ ප්‍රසිද්ධ ප්‍රකාශ සහ ඔවුන්ගේ පිලිවෙත් සම්බන්ධ නිවේදන තුල කිසිදු සැලකිය යුතු ප්‍රතිපත්තිමය මතභේද දැක ගත නොහැකි ය. සංගත ප්‍රභූවේ බලයට හෝ ලාභ ගැරීමට කිසිදු අයුරකින් අභියෝග කිරීමෙන් තොරව දෙදෙනාම ජනතාවාදී ආයාචනා නිකුත් කරති. දෙදෙනා ම එක්සත් ජනපද හමුදා ඉරාකයේ දින නියමයක් නැතිව රඳවා තැබීමට හා නව මැදිහත්වීම් සඳහා සූදානම් කිරීමෙහි ලා මිලිටරිය ප්‍රසාරනය කිරීමට දෙන ප්‍රතිඥා සමග යුද විරෝධී පූච්චානම් සංයෝග කරති.

ඔවුන් අතර පවත්නා ප්‍රතිපත්තිමය මතභේද මහජනතාවගේ අවධානයෙන් විශාල වසයෙන් සඟවනු ලැබ ඇත. ඩිමොක්‍රැටික් පක්ෂ සංස්ථාපිතයේ ඉහල ස්ථර තුල භේදය ආරම්භ වූයේ ඉරාකයේ යුද්ධය අරභයා ය. ස්බිග්නිව් බ්‍රෙසින්ස්කි වැනි විදේශ පිලිවෙත් මූලෝපායඥයන් ක්ලින්ටන් අනන්‍ය කලේ ඉරාකයේ විනාශකාරී මැදිහත්වීමට සහයෝගය දීමේ තීන්දුව සමග ය. බුෂ්ගේ ව්‍යසනකාරී අට වසරක පාලනයට පසුව ලොව වටා එක්සත් ජනපදයට පවත්නා ආර්ථික හා

මූලෝපායික අවශ්‍යතා වඩා බුද්ධිමත්ව හා වඩා කාර්යක්ෂමව ආරක්ෂා කරනු පිනිස විදේශ පිලිවෙතෙහි වෙනසක් සිදු කිරීමේ මාධ්‍යයක් ලෙස මෙම කන්ඩායම ඔබාමාගේ මැතිවරන ව්‍යාපාරය ප්‍රවර්ධනය කලේ ය.

වඩාත්ම අවිනිශ්චිත වියුක්තකරනයන්ගේ පදනම මත, ඔබාමා ඉදිරිපත් කෙරුනේ, ඇමරිකානු සමාජයේ සිටින විවිධාකාර කොටස් සියල්ල ඒකාබද්ධ කොට "ඇමරිකානු සිහිනය" පුනස්ථාපනය කරනු ඇති "වෙනසක" හා "නව දේශපාලනයක" අපේක්ෂකයා ලෙස ය. ඔහුගේ පුද්ගලත්වය -- තරුන, ජාතික දේශපාලනයට නවකයෙක්, බහු-වාර්ගික -- මෙම ස්වයං-ප්‍රකාශිත ඉලක්කය දේහානුරූප කරන බවක් පෙනුනි.

මෙම පුද්ගලත්වය පරෙස්සමින් වර්ධනය කෙරුනි. ප්‍රාන්ස් *24* රූපවාහිනී නාලිකව සමග අප්‍රේල් 19 දා පැවති සම්මුඛ සාකච්ඡාවක දී, බ්‍රෙසින්ස්කි, ඉලිනොයි ප්‍රාන්තයේ මෙම සෙනෙට් සභිකයාට පිටුබලය සපයන අයට එම පුද්ගලත්වයේ පවත්නා වැදගත්කම මෙසේ පෙන්නුම් කලේ ය. ". . . ලෝකය තුල සිය ස්ථානය යලි අර්ථදැක්වීමට ඇමරිකාවට සිදුව තිබේ. තථ්‍ය වසයෙන් ගත් කල, ඇමරිකාවට තමන් ම යලි අර්ථදක්වා ගැනීමට සිදුව තිබේ," යයි ඔහු පැවසී ය. "ඉතින් මා සිතන්නේ ඔහු (ඔබාමා) එම අවශ්‍ය වෙනස සංකේතවත් කරන බව යි. . . ."

බුෂ් පාලන කාලය හා බැඳුනු යුද්ධය, ආර්ථික අනාරක්ෂිත භාවය, දූෂනය හා සාපරාධී ස්වභාවය සම්බන්ධයෙන් විශේෂයෙන් ම තරුන ජනයා අතර පවත්නා පුලුල් හා ගැඹුරු අසහනකාරිත්වය ගසාකෑමට ඔබාමාගේ මැතිවරන ව්‍යාපාරය යොමු කෙරුනු අතර එය මහජන සහයෝගය ගොනු කර ගත්තේ ය.

පක්ෂ සංස්ථාපිතයේ වඩා යුද-හිතකාමී කොටස් අතරින් සහයෝගය රැලි කර ගනිමින් ද එකිනෙකා හා තරග වදින ඩිමොක්‍රැටික් පක්ෂ අවශ්‍යතා කන්ඩායම් අතර ආතතීන් උත්සන්න කර ඇති ද්‍රවාන්තගත වීමේ ක්‍රියාදාමයක් අවුලුවාලමින් ද ක්ලින්ටන් පෙරලා සටනට අවතීර්න වූවා ය. එහි ප්‍රතිඵලයක් ලෙස හටගත් අභ්‍යන්තර අර්බුදය වාර්ගික, ස්ත්‍රී-පුරුෂ හා ප්‍රජාගන රේඛා ඔස්සේ වර්ධනය වන කේන්ද්‍රාපසාරී ප්‍රවනතාවල රූපාකාරයක් ගෙන ඇත යන කාරනාව බැඳී පවතින්නේ ඩිමොක්‍රැටික් පක්ෂයේ සුවිශේෂී පරිනාමය සමග ය.

## නව පිලිවෙත (නිව් ඩීල්) හා පශ්චාත් යුද කාල පරිච්ඡේදවල දී ඇමරිකානු ලිබරල්වාදය

රූස්වෙල්ට් යටතේ ඩිමොක්‍රැටික් පක්ෂය, 1930 ගනන්වල මහා අවපාතය මධ්‍යයේ, පාලක පන්තියේ වඩා දූරදර්ශී කොටස්, අලුතින් තනන ලද කාර්මික සමිති ඇතුලු වෘත්තීය සමිති, වෘත්තීය මධ්‍යම පන්ති, සුලු ගොවීන් සහ නාගරික මධ්‍යම පන්තික තට්ටු, කඩහිමියන්ගේ සිට බුද්ධිමතුන් දක්වා සියල්ලන් ඇතුලු කර ගත් සභාගයක් ගොඩනැගුවේ ය.

සමස්ත ධනපති ක්‍රමයේ ම බිඳවැටීමක හා වැඩෙන සමාජ අසහනයේ කොන්දේසි යටතේ, රූස්වෙල්ට්, යම් කාල පරිච්ඡේදයකට, කාර්මික සමිති තැනීම අවස්ථාවාදී ලෙස දිරිමත් කලේ ය. ඒ මක් නිසා ද යත්, සමාජ විප්ලවය වලකාගනු වස් අවශ්‍ය යයි ඔහු සැලකූ සීමිත සමාජ ප්‍රතිසංස්කරන, බොහෝ සෙයින් සතුරු සංගත ප්‍රභූවකට එරෙහිව, ඉදිරියට තල්ලු කරනු පිනිස ය.

කෙසේ වෙතත්, කාර්මික කම්කරුවන්ගේ වෘත්තීය සමිති අරගලවලට ඔහු දුන් සහයෝගයට තදබල සීමා පැවතුනි. 1937 දී ආංශික ආර්ථික සුවපත් වීම බිඳ වැටී වර්ජන සටන් විප්ලවවාදී මානයන් අත්පත් කර ගැනීමේ තර්ජනය මතු කල විට, රූස්වෙල්ට් අලුතෙන් මතු වූ සීඅයිඕ සංවිධානය හෙලා දැක්කේ ය. 1937 අනුස්මරන දින ජන ඝාතනයේ දී වර්ජක චිකාගෝ වානේ කම්කරුවන් පොලීසිය විසින් ඝාතනය කරනු ලැබීමට පසුව, ඔහු මෙම ප්‍රසිද්ධ ප්‍රකාශය කලේ යඃ "ඔබගේ ගෙවල් දෙකේ ම වසංගතයක්"

කෙසේ වෙතත්, ඇමරිකානු ලිබරල්වාදය, විශේෂයෙන් ම නව පිලිවෙතෙහි (නිව් ඩීල්) ආරම්භක වසර කිහිපය තුල දී, මහ ව්‍යාපාරිකයන්ගේ බලය සීමා කොට වැඩ පොලවල්වලට යම් ආකාරයක කාර්මික ප්‍රජාතන්ත්‍රවාදයක් හඳුන්වා දෙනු වස් ඇමරිකානු ධනවාදය ප්‍රතිව්‍යුහගත කිරීමක් ඉල්ලා සිටි ප්‍රතිසංස්කරන න්‍යාය පත්‍රයකට සාමාන්‍යයෙන් සහයෝගය දුන්නේ ය. බොහෝ නව පිලිවෙතෙහි ඩිමොක්‍රැටිකයෝ ධනය යලි බෙදා හැර වඩා වැඩි සමාජ සමානතාවක් අත්පත් කර ගන්නා පිලිවෙත් වෙනුවෙන් පෙනී සිටියහ.

1937න් පසුව, ඩිමොක්‍රැටික් පක්ෂ ලිබරල්වාදය, ධනවාදය ව්‍යුහාත්මකව ප්‍රතිසංස්කරනය කිරීමේ න්‍යාය පත්‍රයකින් පසු බැසීම ආරම්භ කලේ ය. එම ක්‍රියාදාමය දෙවන ලෝක යුද්ධය මගින් වේගවත් කෙරුනි. ඇමරිකානු ඉතිහාසඥ ඇලන් බ්‍රින්ක්ලේ 1995 පල වූ *The End of Reform* (ප්‍රතිසංස්කරනයේ අවසානය) නම් සිය ග්‍රන්ථයේ මෙසේ සඳහන් කරයිඃ

"දශකයකට පසුව, 1945 දී, ඇමරිකානු ලිබරල්වාදයේ දෘෂ්ටිවාදය කැපී පෙනෙන ලෙස වෙනස් ස්වරූපයකින් පෙනී සිටියේ ය. 1930 ගනන්වල මුල දී (සත්තකින් ම, ඊට පෙර දශක ගනනාවක් තිස්සේ) එතරම් වැදගත්ව තිබූ නවීන ධනවාදය පිලිබඳ විවේචනය, විශාල වසයෙන් අතහැර දැමුනි, නැත හොත් අඩු ගනනේ පූච්චානම් සහගත වැදගත්කමකට නොවැඩි දෙයක් බවට ලඝු කෙරුනි. එහි තැන ගත්තේ, අවශ්‍යයෙන් ම ආර්ථිකයේ පවත්නා ව්‍යුහය සමග සංහිඳියාවට පැමිනි හා ධනවාදයේ නොවැලැක්විය හැකි දෝෂ වෙනුවෙන්

වන්දි ගෙවනු පිනිස රාජ්‍යය යොදා ගැනීමට කැප වූ ලිබරල් අදහස් මාලාවකි. . . .

"කාර්මික ලෝකයේ සෞඛ්‍යය ආරක්ෂා කිරීමේ ආන්ඩුවේ වගකීම ගැන දැන් ලිබරල්වරු කතා කරන විට, ඔවුන් එම වගකීම අර්ථදැක්වූයේ ආර්ථිකය ප්‍රතිව්‍යුහගත කිරීමට කැපවීමක් ලෙසට වඩා ආර්ථිකය සඳහා වූ හා එයට වර්ධනය වීමට උදව් කරන ප්‍රයත්නයක් ලෙස ය. 1930 ගනන් මැද දී නව පිලිවෙතෙහි පූර්වචානම්වලට කේන්ද්‍රීය ගාමකයක් වූ, ධනතාන්ත්‍රිකයන් හා ආර්ථික රාජකීයයන් පාලනය කිරීම හෝ ඔවුන්ට දඬුවම් කිරීම පිලිබඳව ලිබරල්වාදීහු තව දුරටත් එතරම් උත්සුකතාවක් නොදැක්වූහ. ඒ වෙනුවට, ඔවුන් කතා කලේ, සංගත ලෝකයට සමෘද්ධිමත් විය හැකි හා පූර්න සේවා නියුක්තිය පවත්වා ගෙනයාමට ආර්ථිකය සමත් වන සෞඛ්‍ය සම්පන්න වාතාවරනයක් සම්පාදනය කිරීමෙහි ලා තමන්ගේ කැප වීම ගැන ය." (6-7 පිටු)

නව ලිබරල්වාදය අවධාරනයට ලක් කලේ නිෂ්පාදනය හා ධනයේ නිෂ්පාදකයන් නොව ඒ වෙනුවට පාරිභෝජනය හා පාරිභෝගිකයා බව බ්‍රින්ක්ලේ පැහැදිලි කරයි. කම්කරුවෝ පාරිභෝගිකන් ලෙස රටේ ආර්ථික වර්ධනය හා පොදු සෞභාග්‍යය තුලින් වාසි ලබා ගනිමින් සිය තත්වය දියුනු කර ගනු ඇත.

ලිබරල්වාදයේ පශ්චාත් යුද රූපාකාරය "අයිතීන් මත පාදක" එකක් ලෙස නම් කරමින් ඔහු මෙසේ ලියයි:

"කෙටියෙන් කිය තොත්, ප්‍රතිසංස්කරන සම්බන්ධයෙන් (ඒකාධිකාර හා ආර්ථික ව්‍යාකූලත්වය පිලිබඳ ගැටලුවලට ප්‍රතිමුඛ කිරීම වටා කේන්ද්‍රගත වූ සාරභූත වසයෙන් පන්ති-පාදක ප්‍රශ්න මාලාවක් සම්බන්ධයෙන්) පූර්න අවධානය යොමු කිරීමක සිට අයිතීන් සම්බන්ධයෙන් (තනි පුද්ගලයන්ගේ නිදහසට හා අයිතීන්ට හා එනයින් පීඩිත ජනයාගේ හා කන්ඩායම්වල විමුක්තියට කැපවීමක්) පූර්න අවධානය යොමු කිරීමක් දක්වා ඇමරිකානු ලිබරල්වාදයේ මාරු වීම තුල යුද්ධය අර්ථභාරී අවස්ථාවක් විය. අයිතීන් මත පාදක ලිබරල්වාදය, එක්තරා ආකාරයකින්, දශක ගනනාවක් තිස්සේ ප්‍රගතිශීලීන්ට හා නව පිලිවෙත්වාදීන්ට වැදගත්ව තිබූ පුලුල් පරාසයක ආර්ථික ප්‍රශ්නවලින් -- එනම්, කාර්මික ආර්ථිකයේ ව්‍යුහය සහ එය තුල ධනය හා බලය බෙදා හැරීම හා බැඳුනු ප්‍රශ්නවලින් -- පසුබැසීමේ කොටසක් විය."

මෙම මාරුවට ගැලපෙන පරිදි, ඩිමොක්‍රැටික් පක්ෂය "වැඩ කරන මිනිසාගේ" පක්ෂය ලෙස තව දුරටත් පෙනී නොසිටි අතර ඒ වෙනුවට එය "මධ්‍යම පන්තියේ" ආරක්ෂකයා ලෙස තමන්ව ප්‍රදර්ශනය කර ගත්තේ ය.

වෘත්තීය සමිති, ඔවුන්ගේ පාර්ශ්වයෙන්, ඇමරිකානු ලිබරල්වාදයේ මෙම ලඝු කෙරුනු රූපාකාරය වැහැ ගෙන, කාර්මික ප්‍රජාතන්ත්‍රවාදය සඳහා නැත හොත් සංගතවල බලය සීමා කිරීම සඳහා වූ මොන යම් හෝ අරගලයක් අතහැර දමා ඩිමොක්‍රැටික් පක්ෂයට තව දුරටත් ඒකාග්‍ර වී ගත්තේ ය. වාමාංශික හා සමාජවාදී කොටස් ක්ෂමා විරහිත ලෙස විරේක කර දැමීම මගින් ඔවුහු පවත්නා ආර්ථික පර්යායේ කුලුනු ලෙස සිය තත්වය තහවුරු කර ගත්හ.

රූස්වෙල්ට්, සිය 1944 ජනවාරි රාජ්‍ය තත්ව දේශනය තුල දී, "දෙවන අයිතිවාසිකම් පනත" ලෙස ඔහු විසින් නම් කරන ලද සහ සියලු ඇමරිකානුවන්ට යම් ආකාරයක ආර්ථික ආරක්ෂාවක් හා නිශ්චිත සමාජ අයිතීන් සහතික කරනු ඇති පනතක් යෝජනා කලේ ය. "ප්‍රයෝජනවත් හා ප්‍රතිලාභ සහිත රැකියාවක් සඳහා වූ අයිතිය", "ප්‍රමානවත් ආහාර, ඇඳුම් හා විනෝදාස්වාදය සම්පාදනය කිරීමට ප්‍රමානවත් මුදලක් උපයා ගැනීමේ අයිතිය", ගොවීන්ට "ශිෂ්ටසම්පන්න ජීවිතයක්" සඳහා වූ අයිතිය, ව්‍යාපාරිකයන්ට "ඒකාධිකාර මගින් එල්ල කෙරෙන අසාධාරන තරගයෙන් හා ඒවායේ ආධිපත්‍යයෙන් නිදහස්" වීමේ අයිතිය, සියලු පවුල්වලට "ශිෂ්ටසම්පන්න නිවසක්" සඳහා පවතින අයිතිය, "ප්‍රමානවත් වෛද්‍ය සේවා සහ යහපත් සෞඛ්‍යයක් ලබා ගැනීමේ හා භුක්ති විඳීමේ අවස්ථාව" සඳහා වූ අයිතිය, "මහලු විය, ලෙඩ රෝග, හදිසි අනතුරු හා විරැකියාව නිසා ඇතිවන ආර්ථිකමය භීතියෙන් ප්‍රමානවත් ආරක්ෂාවක්" ලැබීමේ අයිතිය සහ "හොඳ අධ්‍යාපනයක්" සඳහා වූ අයිතිය එයට ඇතුලත් විය.

රූස්වෙල්ට් ම තමාගේ යෝජනාව කොතෙක් දුරට බැරෑරුම්ව ගත්තේ ද යන්න විවාදිත කාරනාවකි. එය කෙසේ වෙතත්, යුද්ධයට පසුව ඔහුගේ "දෙවන අයිතිවාසිකම් පනත" මලකුරක් බවට පත් විය.

## නව පිලිවෙත් සභාගය බිඳ වැටීම

පශ්චාත් යුද කාලීන ඇමරිකානු ලිබරල්වාදයේ හා එය හා බැඳුනු "මධ්‍යම පන්තික" පාරිභෝගික සමාජයේ විශ්වාසනීයත්වය රදා පැවතියේ යුද්ධයට පසුව හටගත් ආර්ථික ප්‍රසාරනයේ සහ සදා වර්ධනය වන සෞභාග්‍යයේ අඛන්ඩතාවක් මත ය. එහෙත් 1960 ගනන් අග වන විට, උත්පාතය ලිහි යාම ඇරඹුනි. වියට්නාම යුද්ධයේ ද සිවිල් අයිතිවාසිකම් සඳහා වූ අරගලයේ ද නාගරික කැරලිවල ද පිරිහෙන ආර්ථික කොන්දේසි මගින් අවුලුවාලන ලද වර්ජන රැල්ලක ද බලපෑම නව පිලිවෙත් සභාගයට වල කැපී ය. වසර කිහිපයක් තුල දී, ඩිමොක්‍රැටික් පක්ෂය නව පිලිවෙතෙහි සමාජ ප්‍රතිසංස්කරන ප්‍රතිපත්තිවලින් විවෘතව දුරස්ථ වී ගත්තේ ය.

1970 ගනන්වල දී ආර්ථිකය එක තැන් පල් වීමේ හා පිම්මේ නැගෙන උද්ධමනයේ කොන්දේසි යටතේ, මධ්‍යම පන්තියේ විශාල කොටස් මෙන් ම වඩා හොඳ ජීවන තත්වයක් භුක්ති විඳි කම්කරු ස්ථර, ඩිමොක්‍රැටික්

පක්ෂය සමග බැඳී තිබුනා වූ ද ඔවුන් මෙන් ම දුර්වල වී තිබුනා වූ ද ලිබරල් ප්‍රතිසංස්කරන පිලිවෙත් සම්බන්ධයෙන් අපේක්ෂාභංගත්වයට පත්වන්ට පටන් ගති. ඔවුන්ට එම පිලිවෙත් පෙනුනේ මධ්‍යම ආදායම් මට්ටමක් සහිත ජනයා මත වඩ වඩා විශාල බඳු බර පටවන ගමන් ආර්ථික අර්බුදය තව දුරටත් සංකීර්න කරන පිලිවෙත් ලෙස ය.

පාරිභෝගික සමාජය ප්‍රසාරනය කිරීම හරහා ජීවන මට්ටම් ඉහල දැමීම ව්‍යර්ථ වූ විට, ඩිමොක්‍රැටික් පක්ෂය, 1972 මැක්ගවර්න් ව්‍යාපාරයෙන් ආරම්භ කරමින්, තමන්ව ම යලි හැඩ ගන්වා ගැනීමට උත්සාහ දැරී ය. දුර දිග යන ප්‍රජාතන්ත්‍රවාදී ප්‍රතිසංස්කරනයක් ලෙස ඉදිරිපත් කෙරුනු පිලිවෙතක් මගින්, සංවිධානය "සහභාගී" ව්‍යුහ එක ස්ථරයක් මත තව ස්ථරයක් පවතින පරිදි ස්ථරීකරනය වූ අතර වාර්ගික හා ලිංග විවිධත්වය වඩ වඩා ආප්ත පාඨය බවට පත් විය. පක්ෂය අනන්‍යතා දේශපාලන ප්‍රතිපත්තිය සිය ව්‍යුහය තුලට ම උකහා ගත්තේ ය.

විවිධ වාර්ගික හා ප්‍රජාගන කොටස් අතර හා කාන්තාවන් අතර සිටින ප්‍රභූ ස්ථරවලට වරප්‍රසාද ප්‍රදානය කරනු වස් "ධනාත්මක ක්‍රියාමාර්ග" හා ඊට සමාන පිලිවෙත් යොදා ගැනුනු අතර වැඩ කරන ජනයාගේ, අප්‍රිකානු-ඇමරිකානු හා ලතින් ඇමරිකානු ජාතිකයන්ගේ මෙන් ම සුදු පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ පුලුල් ජන කොටස්වල ජීවන මට්ටම් එක තැන පල් වුනි, නැත හොත් කඩා වැටුනි.

ජනාධිපති අපේක්ෂකත්වය සඳහා ප්‍රධාන තරගකරුවන් පක්ෂ හා ඡන්දයෙන් පත් වූ නිලධාරින් විසින් තෝරා ගනු ලැබෙන හා අවසාන තේරීම ජාතික සම්මේලනයේ නියෝජිතයන් විසින් කරනු ලබන පැරනි ක්‍රියාදාමය, ප්‍රාථමික මැතිවරන හා පක්ෂ ප්‍රාදේශීය කමිටු මගින් විස්ථාපනය කරමින් වත්මන් අපේක්ෂක ක්‍රමය තනන ලදි. මෙමගින් මැතිවරන ක්‍රියාදාමයේ වාචාල ස්වරූපය තව දුරටත් උත්සන්න කෙරුනේ, අපේක්ෂකයන් ඒ හෝ මේ වාර්ගික, ප්‍රජාගන හෝ ස්ත්‍රී-පුරුෂ කන්ඩායමට යොමු කෙරුනු සටන් පාඨවල හා ප්‍රතිරූපවල පදනම මත ඩිමොක්‍රැටික් පක්ෂය තුල විවිධ සහයෝගී කන්ඩායම්වලට ආයාචනා කරමිනි.

ඩිමොක්‍රැටික් පක්ෂය, සිවිල් අයිතිවාසිකම් සංස්ථාපිතය, කලු ජාතිකයන්ගේ හා සෙසු සුලුතරයන්ගේ වඩා වරප්‍රසාදිත ස්ථර, කාන්තාවාදී සංවිධාන, සම-ලිංගික අයිතිවාසිකම් සඳහා වූ කන්ඩායම්, පරිසරවාදීන් ආදීන් ඇතුලු එකිනෙකා සමග තරග වදින අවශ්‍යතා කන්ඩායම්වලින් සමන්විත අනියත රූපී සන්ධානයක රූපාකාරය අත්පත් කර ගත්තේ ය. පැරනි නව පිලිවෙත් සභාගය තුල කේන්ද්‍රීය ක්‍රියාකලාපයක් ඉටු කර තිබූ වෘත්තීය සමිති, ඩිමොක්‍රැටික් පක්ෂය හා සන්ධානගත වූ බොහෝ අවශ්‍යතා කන්ඩායම් අතරින් එකක් බවට පත් විය.

ඇමරිකානු ධනවාදයට ගෝලීය ආර්ථිකය තුල ඇති තත්වය කඩා වැටීමට ප්‍රතිචාර වසයෙන් එක්සත් ජනපද ආර්ථිකයේ සිදු කෙරුනු ප්‍රතිව්‍යුහකරනය සඳහා පක්ෂය දුන් සහයෝගය සමග බැඳී ඩිමොක්‍රැටිකයන්ට ලැබුනු කම්කරු පන්ති සහයෝගයේ ඛාදනය ද වේගවත් විය. ගුවන් සේවාවන් හා ට්‍රක් රථ සේවාවන් සම්බන්ධ නියාමනයන් ඉවත් කිරීමේ ඔවුන්ගේ පිලිවෙත් සමගින් නව පිලිවෙත හා බැඳුනු ප්‍රතිසංස්කරනවලට එරෙහි ප්‍රථම මූලික ප්‍රහාරය දියත් කලේ කාටර් යටතේ ඩිමොක්‍රැටිකයන් ය. 1979 දී, කාටර් ඇමරිකානු මහ බැංකුවේ සභාපති ලෙස පෝල් වෝකර් පත් කලේ ය. මහජන විරැකියාවේ සහ කම්කරු පන්තියේ වැටුප්වලට හා ජීවන මට්ටම්වලට එරෙහි ප්‍රහාරයක පදනම මත පද්ධතියෙන් උද්ධමනය මිරිකා දමනු පිනිස වෝකර් පොලී අනුපාතික නාටකාකාර ලෙස ඉහල දැමී ය.

ඩිමොක්‍රැටිකයෝ 1979-1980 ක්‍රයිස්ලර් සමාගම ගලවා ගැනීමේ දී වැටුප් කප්පාදු සඳහා වූ තල්ලුව ආරම්භ කල අතර තව දුරටත් ලාභදායක නොවූ මූලික කර්මාන්තවල විශාල කොටස් වසා දමනු පිනිස මහ ව්‍යාපාරිකයන් විසින් ක්‍රියාවට දමන ලද "කර්මාන්තහරනයට" ද සහාය දුන්හ.

අනන්‍යතා දේශපාලනය වැලඳ ගැනීමේ සිය පිලිවෙතෙහි කොටසක් ලෙස, ඩිමොක්‍රැටික් පක්ෂය, සමාජ සමානතාව සඳහා වූ මොන යම් හෝ ඉල්ලීමක් මුලුමනින් ම ඉවතලනු පිනිස එය "ඇමරිකානු ප්‍රජාතන්ත්‍රවාදය" ලෙස හැඳින් වූ දෙය සඵල වසයෙන් යලි අර්ථදැක්විය. 1980 ගනන්වල සිට, ඩිමොක්‍රැටික් පක්ෂය, පහල සිට ඉහලට ධනය දැවැන්ත වසයෙන් යලි බෙදා හැරීමක් එල ගැන්වීමෙහි ලා රිපබ්ලිකන්වරු සමග සහයෝගී වෙමින් සිය අතීත කම්කරු පන්තික සහයෝගී පදනම්වලින් තව දුරටත් විරසක විය.

## දේශපාලන පුද්ගලතා අතර සටනක්

දැන්, ජනතා අප්‍රසාදයට ලක් වූ යුද්ධයක හා ගැඹුරු වන ආර්ථික පසුබැස්මක කොන්දේසි යටතේ සිදු වන, අප්‍රිකානු-ඇමරිකානුවකුට එරෙහිව කාන්තාවක් පිහිටුවීමේ තරගයක් තුල දී, අනන්‍යතා දේශපාලනය වැලඳ ගැනීමේ ඩිමොක්‍රැටික් පිලිවෙතෙහි දේශපාලන ප්‍රතිවිපාක පුපුරන සුලු ස්වරූපයකින් මතු වෙයි.

පෙනිසිල්වේනියාවේ දී, සිය පක්ෂපාතිත්වය කුමන අපේක්ෂකයාට ද යන්න ප්‍රසිද්ධියේ ප්‍රකාශ කර ඇති නියෝජිතයන් අතර ඔබාමාට පවතින අනභියෝගී බහුතරයට මුහුන දෙනු වස්, ක්ලින්ටන්, සිය දක්ෂිනාංශික මූලෝපාය උත්සන්න කලා ය. රැඩිකල් වෙදර් අන්ඩර්ග්‍රවුන්ඩ් සංවිධානයේ හිටපු සාමාජිකයකු ලෙස ඔහුගේ අතීත සබඳතා සම්බන්ධයෙන් ඇගේ විරුද්ධවාදියා දඩයම් කිරීමේ උත්සාහයක යෙදුනු ඇය ඉරානය භයානක යක්ෂයකු ලෙස මවා පෙන්වා ත්‍රස්ත ප්‍රහාර පිලිබඳ භීතියක් ඇවිලවීමට ද ප්‍රයත්න දැරූ අතර

(ඔහුගේ හිටපු පූජකවරයා වන ජෙරමියා රයිට් සමග වන ඔහුගේ සබඳතා සම්බන්ධයෙන් ඔබාමා හෙලා දකිමින්) වාර්ගික අගතීන්ට තුනී ලෙස ආවරනිත ආයාචනා සිදු කලා ය.

ඔබාමා, පුද්ගලික අරමුදල් රැස් කිරීමේ අවස්ථාවක දී, වැටුප් කප්පාදු, දොට්ට දැමීම් හා ගැඹුරු වන ආර්ථික අනාරක්ෂිත භාවය සම්බන්ධයෙන් පෙනිසිල්වේනියාවේ කුඩා නගරවල හා ගම්බද ප්‍රදේශවල කම්කරු පන්තික ඡන්දදායකයන් දක්වන "වෛරය" ද ඔවුන්ගේ ඉරනම සම්බන්ධයෙන් රිපබ්ලිකන් හා ඩිමොක්‍රැටික් යන දෙපාර්ශ්වයේ ම පාලනාධිකායන් දක්වන නොතැකීම ද ගැන අපරීක්ෂාකාරී ලෙස කතා කල විට, තීරනාත්මක මොහොත එලඹුනි. ඇමරිකාවේ පන්ති සබඳතාවන්ගේ යථාර්ථය ගැන සාකච්ඡාවක් ඇරඹීමේ මූලික පාපය සිදු කල ඔබාමා, ආගමට හා තුවක්කුවලට "ඇලිගැලී ගැනීම" සහ ආගමනිකයන්ට හා විදේශ කම්කරුවන්ට දොස් පැවරීම ලෙස, වැඩ කරන ජනතාව තුල ආර්ථික අයිතීන් අහිමි කිරීම විකෘත ප්‍රකාශනයක් අත්පත් කර ගන්නා බව යෝජනා කිරීම මගින්, එය තව දුරටත් සංකීර්න කලේ ය.

මේ සම්බන්ධයෙන්, මාධ්‍ය, රිපබ්ලිකන්වරු සහ ක්ලින්ටන් ඔබාමා "බමුනු මතධාරියකු" යයි සම්ච්චලයට ලක් කරමින් පැහැදිලි කලේ, ජනාධිපතිවරන ව්‍යාපාරය තුල දී පන්ති සතුරුකම්වලට කෙරෙන මොන යම් හෝ විවෘත ආයාචනයක් පාලක කව නොඉවසන බව යි. එම පනිවිඩය අවබෝධ කර ගත් ඔබාමා සමාව ඉල්ලූ අතර පෙනිසිල්වේනියා මැතිවරන ව්‍යාපාරයේ සෙසු කාල පරිච්ඡේදය මුලුල්ලේ ආරක්ෂාකාරී පිලිවෙතක් අනුගමනය කලේ ය.

මෙම සිද්ධිය මගින් පෙන්නුම් කෙරුනේ, ඇමරිකානු සමාජය මත ආධිපත්‍යය දරන අති මූලික පන්ති ප්‍රශ්න මග හැරීම මත ඇමරිකානු ලිබරල්වාදය හා ඩිමොක්‍රැටික් පක්ෂය කෙතරම් නම් පරිපූර්නව පාදක වී ඇති ද යන වග යි. ඒ වෙනුවට, ඔවුහු වර්ගය, ලිංග භේදය, වයස යනාදී ද්විතියික කාරනා ගැන උද්යෝගිමත් ලෙස අවධානය යොමු කර ඇති අතර එමගින් එවන් භේද උත්සන්න කොට ඒවාට විසකුරු ස්වභාවයක් ලබා දෙති.

පක්ෂය කිසිදු ස්ථිරසාර ක්‍රියාමාර්ගයක් මත පාදක නොවන බැවින්, එහි අපේක්ෂකයන් පක්ෂ සංයෝජනයේ විවිධ සංචරක කොටස් වෙතින් සහයෝගය දිනා ගනු වස් සැලසුම් කෙරුනු පුද්ගලත්වයන් ආරෝපනය කර ගැනීම මගින් සිය ආයාචනා නිකුත් කල යුතු ය. වත්මන් ඩිමොක්‍රැටික් ප්‍රාථමික මැතිවරනය තුල මෙම ක්‍රියාදාමය මුග්ධ ස්වරූපයන් ගෙන තිබේ.

පල්ලම් බැසීමට ලක්ව ඇති සිය මැතිවරන ව්‍යාපාරය ප්‍රානවත්ව තබා ගනු වස් පෙනිසිල්වේනියාවේ දී නිශ්චිත ජයග්‍රහනයක අවශ්‍යතාවයෙන් පෙලුනු ක්ලින්ටන්, දෘඪතර කම්කරු පන්තික කාන්තාවක, යම් ආකාරයක ස්ත්‍රී රොකී බැල්බෝ කෙනෙකු ලෙස, තමාව ප්‍රතිනිර්මානය කර ගත්තා ය. ඔවුන් දෙදෙනා ධවල මන්දිරය හැර ගියාට පසුව ගත වූ සත් වසරක කාලය තුල දී ඇයගේ හිටපු ජනාධිපති ස්වාමි පුරුෂයා සමග එක්ව ඩොලර් මිලියන 109ක මුදලක් රැස් කර ගෙන ඇති හිටපු ප්‍රථම ආර්යාවක් සම්බන්ධයෙන් ගත් කල මෙය නිසැකව ම ඇදහිය නොහැකි දෙයක් ලෙස පෙනෙයි.

ඔහුගේ පාර්ශ්වයෙන් ගත් කල, ඔබාමා, තමන්ව ඉදිරිපත් කර ගන්නේ, සංගත ලොබිකාරයන් වොෂිංටනයෙන් පලවා හැර ආන්ඩුව "පෙරලා මහජනතාවට" භාර දීමට යන ජනප්‍රිය නැගිටීමේ ව්‍යාපාරයක නායකයකු ලෙස ය. එමෙන් ම ඔහු කියා සිටින්නේ, "වෙනසක්" හා "නව දේශපාලනයක්" සඳහා වන සිය මෙහෙවර තුල දී, සියලු තරාතිරම්වලට අයත් කොටස් -- සුදු හා කලු, ධනවත් හා දුප්පත්, තරුන හා මහලු, පුරුෂ හා ස්ත්‍රී, සමලිංගික හා සාමාන්‍ය, ඩිමොක්‍රැටික් හා රිපබ්ලිකන් -- ඒකාබද්ධ කිරීමට තමන් ක්‍රියා කරනු ඇති බව යි.

ඩොලර් මිලියන 150කට සමාන මුදලක් රැස් කර ඇති ඔහුගේ මැතිවරන ව්‍යාපාරය මේ වන විට එයින් ඩොලර් මිලියන 42ක මුදල් සම්භාරයක් අත ඉතිරි කර ගෙන සිටින බවත් ඔහුගේ ප්‍රධාන ආධාරකරුවන් අතර ලෝකයේ සිටින සමහර ධනවත්ම පුද්ගලයන් සිටී යන කරුනත් පසෙක තැබුවා වුවත්, සියලු කොටස් අලලා ගත් එකමුතුවක් ගොඩනැගීට ඔබාමා දෙන පොරොන්දුව හිස් කතන්දරයක් පමනක් නොව මුලුමනින් ම විකාර සහගත ප්‍රකාශයක් ලෙස පෙනී යන්නේ ඔහුගේ ම පක්ෂය කිසිදු බලාපොරොත්තුවක් තැබිය නොහැකි ලෙස භේද වී සිටින තතු යටතේ ය.

ඉරානය "අතු ගා දැමීමට" ක්ලින්ටන් මෑත දී කල තර්ජනය මගින් අවධාරනය කෙරුනු පරිදි, ඩිමොක්‍රැටික් පක්ෂයේ අර්බුදය අධිරාජ්‍යවාදී පක්ෂයක අර්බුදයයි. ඔහුගේ පාර්ශ්වයෙන් ගත් කල, ඔබාමා පකිස්ථානයට බෝම්බ දැමීමට තර්ජනය කලේ එතරම් වැඩි කලකට ඉහත දී නොවේ.

ප්‍රාථමික මැතිවරනය වංචාව හා රැවටිල්ල හා බැඳුනු දේශපාලන අර්බුදයක ප්‍රදර්ශනයක් බවට පිරිහී තිබේ. ඩිමොක්‍රැටික් පක්ෂයට ප්‍රගතිශීලී සමාජ වෙනසක වාහකයක් ලෙස සේවය කල හැකි ය යන මතය කෙතරම් නම් අපේක්ෂාභංග හා නොමග යවන සුලු ද වන වග එමගින් පෙන්නුම් කෙරී ඇත.

© www.wsws.org